**ශීර්ෂය 274 - අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය, අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 274 - අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජූලි 31 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්ය සාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 විගණන නිරීක්ෂණය**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.13 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටු කිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන් දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128 (1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරීගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණ ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128 (1) (අ) | රජය විසින් නියම කර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලසුම් කර ක්‍රියාත්මක කරන බව ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. ක්‍රියාකාරී සැලැස්ම අංග සම්පූර්ණ හා නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි. | 2.3.1 |
| | | 2. ලේඛන හා පොත් පවත්වා නොතිබීම | 2.11 |
| | | 3. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.4.1 |
| | | 4. නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් පැවතීම | 2.5 |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව | අනුකූල නොවීම | 2.12 |
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත් බව හා අවංකභාවය යන කරුණු | 1. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම | 2.3.2(අ) |

| | | |
|---|---|---|
| පිළිබඳ නිසි සැලකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව | 2. අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගැනීම | 2.3.2 (ආ) |
| | 3. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් | 2.3.2 (ඇ) |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

(i) දිස්ත්‍රික්කයේ ජනතාවගේ දිළිඳුකම අවම කිරීමට මුල පිරීම.

(ii) සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය.

(iii) දිස්ත්‍රික් ව්‍යාපෘති පරිපාලනය හා මෙහෙයවීම.

(iv) ආදායම් එකතු කිරීම.

(v) රජයේ වත්කම් සුරක්ෂිත කිරීම හා පාලනය.

(vi) ආපදා සහන සහ පුනරුත්ථාපන ව්‍යාපෘති පාලනය.

(vii) මැතිවරණ කටයුතු සම්බන්ධීකරණය.

(viii) කොට්ඨාස මට්ටමේ සහ ගම් මට්ටමේ නිලධාරීන් හා සංවිධාන මගින් රජයේ කටයුතු සමායෝජනය කිරීම හා නීතියෙන් පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම.

(ix) වෙනත් අමාත්‍යාංශවල හා දෙපාර්තමේන්තුවල නියෝජිතයා ලෙස කටයුතු කිරීම.

(x) පළාත් සභා කාර්යයන්ට සහය වීම සහ දිස්ත්‍රික්කයේ සියළුම පරිපාලන කටයුතු සිදු කිරීම.

## 2.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ආයතන හා එමගින් ඉටු කළ යුතු කාර්යභාරයන්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ස්ථාපිත කර ඇති ආයතන හා ඒවායේ කාර්ය භාරය පහත දැක්වේ.

| **දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ආයතන** | **ස්ථාපිත කිරීමේ අධිකාරි බලය** | **කාර්ය භාරය** |
| --- | --- | --- |
| **ප්‍රාදේශීය ලේකම් කාර්යාල**<br>(අ) පදවිය<br>(ආ) කැබිතිගොල්ලෑව<br>(ඇ) මැදවච්චිය<br>(ඈ) රඹෑව<br>(ඉ) හොරොව්පොතාන<br>(ඊ) ගලෙන්බිඳුනුවැව<br>(උ) කහටගස්දිගිලිය<br>(ඌ) නැගෙනහිර නුවරගම් පළාත<br>(එ) නාච්චාදූව<br>(ඒ) මධ්‍යම නුවරගම් පළාත<br>(ඔ) නොච්චියාගම<br>(ඕ) මහවිලච්චිය<br>(ක) තලාව<br>(ග) තඹුත්තේගම<br>(ජ) රාජාංගනය<br>(ට) ගල්නෑව<br>(ඩ) ඉපලෝගම<br>(ණ) තිරප්පනේ<br>(ත) මිහින්තලේ<br>(ද) පලුගස්වැව<br>(න) කැකිරාව<br>(ප) පලාගල | 1992 අංක 58 දරන බලතල පැවරීමේ (ප්‍රාදේශීය ලේකම්වරයන්ට) පනත | ලිඛිත නීතිය මගින් ඔහුට පවරන ලද හෝ නියම කරන ලද හෝ වෙන් කර දෙන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක්, ඒ කොට්ඨාසය ඇතුළත ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළයුතුය. |

## 2.3 කාර්යසාධනය

### 2.3.1 සැලසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) දිස්ත්‍රික් ලේකම් වෙත වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් ලැබෙන ප්‍රතිපාදන උපයෝජනයට අදාළ ක්‍රියාකාරකම් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ ස්ථාපිත ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 මගින් අපේක්ෂිත ප්‍රධාන කාර්යයන් 10 ඉටු කෙරෙන ආකාරයට ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**2.3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබානොගැනීම**

අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කර තිබුණ ප්‍රධාන කාර්යභාරයන් 2 ක් යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට 2016 සහ 2017 වර්ෂ සඳහා රු.මිලියන 29 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට රුපියල් මිලියන 20.9 ක් උපයෝජනය කර තිබු නමුත්, එයින් අපේක්ෂිත නිමැවුම් මට්ටම අත්පත් කර ගෙන නොතිබුණු පහත අවස්ථා නිරීක්ෂණය විය.

| | ප්‍රධාන කාර්ය භාරය | සලසා තිබුණු ප්‍රතිපාදනය | කාර්යසාධක දර්ශකය අනුව | | |
|---|---|---|---|---|---|
| | | | ඉටු කළයුතුව තිබුණු ප්‍රමාණය | ඉටු නොකළ ප්‍රමාණය | නිෂ්ඵල වූ ප්‍රතිපාදනය |
| | | රු.මිලියන | | | රු.මිලියන |
| (i) | ජංගම වෙළඳකුටි සකස් කර ප්‍රතිලාභීන් වෙත බෙදා දීම | 22.3 | 228 (ජංගම වෙළඳ කුටි) | 15 | 0.97 |
| (ii) | ප්‍රතිලාභීන් වෙත කිරි ගවයින් ලබාදීම | 6.3 | 59 (කිරි හරකුන්) | - | - |

- 2016 වර්ෂය තුළ රු.14,657,325 ක් ගෙවා මිලදී ගෙන ප්‍රතිලාභීන් වෙත බෙදා දී තිබුණු ජංගම වෙළඳ කුටි 150 ක් සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 4 ක සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී ප්‍රතිලාභීන් වෙත ලබාදී තිබූ වටිනාකම රු.977,174 ක් වූ ජංගම වෙළඳ කුටි 10 ක් නිශ්කාර්යව පැවතුණි.

- 2017 වර්ෂය තුළ ජංගම වෙළඳ කුටි 78 ක් සකස් කර බෙදාහැරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබූ නමුත්, 2018 ජූලි 30 දින වන විට එම වෙළඳ කුටි සකස් කර ප්‍රතිලාභීන් වෙත බෙදා දී නොතිබුණි.

- කිරිගව පාලන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන ලබාදුන් අමාත්‍යාංශය විසින් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ඊට අදාළ නිර්ණායක සකස් කර නොතිබුණි. කෙසේ නමුත්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මහපෙන්වීම් හා අත්පොත් සංග්‍රහය අනුව දෛනිකව කිරි ගවයෙකුගෙන් කිරි ලීටර් 15 ක් ලබාගතයුතු වුවද, ප්‍රදේශයේ පශු වෛද්‍යවරුන් ලබාදුන් වාර්තා අනුව කිරි ලීටර් 7 ක් ලබා ගත යුතු වේ. නමුත්, නියැදි පරීක්ෂණයට භාජනය කරන ලද කිරිගවයන්ගෙන් දෛනික කිරි ලබාගැනීමෙහි ප්‍රමාණය කිරි ලීටර් 2 කට අඩු මට්ටමක පැවතුණි.

**(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

(i) කහටගස්දිගිලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පඩරුල්ලාව වැවේ සිට කොක්එබේවැව දක්වා ඇල මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.495,000 ක් වැයකර, වැඩ නිමකර තිබුණද, වැව් දෙක ඉහළ මට්ටමක පිහිටා තිබීමත්, ඇල මාර්ගය පහළ මට්ටමක පිහිටා තිබීමත් නිසා පඩරුල්ලා වැවේ සිට කොක්එබේවැවට ජලය ගෙන යා නොහැකිව තිබුණි.

(ii) නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රු.601,848 ක් වැයකර ඉදිකර තිබූ කුඩාවැව ක්‍රීඩාංගනය හා එම කොට්ඨාසයේ රු.426,362 ක් වැයකර සංවර්ධනය කර තිබූ චන්ද්‍රාණි පුර ක්‍රීඩාංගනය යන ක්‍රීඩාංගන භාවිතයට නොගෙන නිශ්කාර්යව පැවති අතර, එම ක්‍රීඩාංගනවල දැල් වැට හා ගේට්ටු පියන් 2018 අප්‍රේල් 25 දින වන විටත් කඩා දමා තිබුණි.

**(ඇ) ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

පලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විමධ්‍යගත සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රදේශයේ තරුණයින් 10 දෙනෙකුට රියදුරු බලපත්‍ර ලබාදීමට අනුමත කර තිබූ ව්‍යාපෘතිය යටතේ අදාළ කාර්ය නිම කිරීම සඳහා ලංකා ගමනාගමන මණ්ඩලයේ අනුරාධපුර ඩිපෝ කළමනාකරු වෙත රු.100,000 ක මුදලක් ගෙවා තිබූ නමුත්, 2018 ජූනි 06 දින වන විටත් අදාළ රියදුරු බලපත්‍ර ලබාදී නොතිබුණු අතර, බලපත්‍ර ලබාදීම ප්‍රමාද වීම හේතුවෙන් එක් අයෙකු පෞද්ගලිකව මුදල් ගෙවා රියදුරු බලපත්‍ර ලබාගෙන තිබුණි. තවද, එම කාලසීමාව තුළ එක් අයෙකු මියගොස් තිබුණි.

### 2.3.3 තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළයුතුව පවතින අතර, සමාලෝචිත වර්ෂයට අදාළව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

### 2.3.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළ සහ පෙර වර්ෂයට අදාළ එම වාර්තා 2018 ජූලි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 2.4 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබාගැනීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබාගතයුතු වූ රු.මිලියන 130.5 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 90.9 ක ප්‍රතිපාදන පමණක් උපයෝජනය කර තිබුණි.

| වැය විෂයය | වැය විෂය විස්තරය | සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය |
|---|---|---|---|---|
| | **සැපයීම්** | රු. | රු. | රු. |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 13,001,575 | 12,999,086 | 2,489 |
| 1203 | ආහාර පාන හා නිල ඇඳුම් | 72,000 | 44,430 | 27,570 |
| 1302 | යන්ත්‍ර සූත්‍ර සවිකිරීම් | 2,600,000 | 2,587,875 | 12,265 |
| 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2,062,413 | 1,745,125 | 317,288 |
| 1409 | වෙනත් | 20,000,000 | 19,903,712 | 96,288 |
| 2003 | වාහන | 1,600,000 | 1,585,040 | 14,960 |
| 2103 | යන්ත්‍ර අත්පත් කරගැනීම | 1,200,000 | 1,097,723 | 102,277 |
| 2104 | ගොඩනැගිලි ඉදිකිරීම | 90,000,000 | 50,911,531 | 39,088,469 |
| | එකතුව | 130,535,988 | 90,874,522 | 39,661,606 |

### 2.4.1 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ ජංගම වෙළඳ කුටි මිලදී ගැනීමේ දී තාක්ෂණික ඇගයීම් කමිටුව සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් සාම්පල් ගෙන්වා අදාළ පිරිවිතරවලට අනුකූලව පරීක්ෂා කළයුතු වුවද, තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් අවම මිල ගණන් ඉදිරිපත් කරන ලද ලංසුකරුගේ සාම්පලය පමණක් පරීක්ෂා කර තිබුණි. එසේම, අනෙකුත් ලංසුකරුවන් ඉදිරිපත් කරන ලද ලංසු ලියකියවිලි වලට අදාළ සාම්පල් පරීක්ෂා කිරීමකින් තොරව එම වෙළඳ කුටි පිරිවිතරවලට අනුකූල නොවන බවට තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර ලංසු ප්‍රතික්ෂේප කර තිබුණි. තවද, එම ලංසු ලියකියවිලි අනුව ජංගම වෙළඳ කුටියේ පිටත ආවරණ, ජනෙල්, දොරවල් සහ වහළය සඳහා 0.47 mm Zink Aluminum Colour Flat Sheet සහ වෙළඳ කුටියේ තට්ටුව හා පතුල (ගෙබිම) සඳහා Timber plank (22mm) දැව යොදා ගත යුතුව පැවතුණ නමුත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මිලට ගත් වෙළඳ කුටිවල බිම සඳහා MDF Board යොදාගෙන තිබුණි. තවද, බොහෝ ජංගම වෙළඳකුටිවල දොර ජනෙල් පියන් සහ කුටිය වටා සාමාන්‍ය වෙළඳපොලේ පවතින වානේ තහඩුවක් යොදා එහි ඇතුළත තීන්ත ආලේප කර තිබුණි.

(ආ) කැබිතිගොල්ලෑව සහ මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ගව පාලන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු.6,268,500 ක් වටිනා කිරි ගවයින් 59 දෙනෙකු ප්‍රසම්පාදන පටිපාටියට බැහැරව ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ ගව පට්ටි පාලනය කරනු ලබන ගව හිමියෙකුගෙන් මිලදී ගෙන බෙදාහැර තිබුණි. එසේම, එම කිරිගවයන්ගෙන් ලබාගත හැකි වූ කිරි ප්‍රමාණය දිනකට ලීටර් 2 කට අඩු මට්ටමක පැවතුණි. නමුත්, පශු වෛද්‍යවරුන්ගේ නිර්දේශ අනුව දිනකට කිරි ලීටර් 7 ක අවම ප්‍රමාණයක්වත් දොවා ගත හැකි කිරි ගවයින් ලබාදිය යුතු බව නිරීක්ෂණය වුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

### (අ) රජය සතු වත්කම් උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිතා නොකිරීම

(i) 2015 වර්ෂය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ වාහන සේවා කිරීමේ ස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් රු.1,164,028 ක් වැයකර තිබුණි. නමුත්, ඉදිකර තිබූ සේවා ස්ථානයේ සැලසුම් කිරීමේ හා ස්ථානගත කිරීමේ වැරදි හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා වාහන සේවා කිරීම සඳහා හෝ වාහන සේදීම සඳහා භාවිතා කර නොතිබුණි.

(ii) 2014 දිවිනැගුම සංවර්ධන වැඩසටහන යටතේ, ඉපලෝගම හා තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ප්‍රතිලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධනය වෙනුවෙන් තෝරා ගත් ගොවීන් වෙත බෙදා දීම සඳහා මිලදී ගෙන තිබූ වටිනාකම රු.4,530,951 ක කෘෂි උපකරණ ඒකක 12,152 ක් 2017 දෙසැම්බර් 31 දින දක්වා බෙදා නොහැර ගබඩාවේ නිෂ්කාර්ය ලෙස රඳවා තිබුණි.

### (ආ) වත්කම්වලින් රජයට ලැබෙන ආදායම් නොලැබීම

කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැලැපුලියන්කුලම ගමේ හීන්ඔය ඇලේ අනවසර වැලි ගොඩ දමන්නන්ට වාසි සැලසෙන ලෙස ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී විසින් කටයුතු කිරීම නිසා රු.812,500 ක ආදායමක් රජයට අහිමි වී තිබුණි. මේ සම්බන්ධව ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ 8 වන වගන්තිය පරිදි විධිමත් විනය පරීක්ෂණයක්ද පවතින නමුත් එය 2018 ජූනි 30 දින වන විටත් නිම වී නොතිබුණි.

## 2.6 අවිධිමත් ගනුදෙනු

කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කෙලින්වීදිය, මරදන්කඩවල ලිපිනයෙහි පිහිටි කැකිරාව සුහසාධක සංගමය වෙත රු.500,000 ක් වටිනා විවිධ භාණ්ඩ හා උපකරණ 2016 විමධ්‍යගත අයවැය වැඩසටහනේ ප්‍රතිපාදන මගින් ලබාදී තිබූ නමුත්, භෞතික පරීක්ෂාවේදී ඉහත කී ලිපිනයෙහි හෝ වෙනත් ස්ථානයක එවැනි සංගමයක් සොයාගත නොහැකි විය.

## 2.7 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

අනුරාධපුර දිස්ත්‍රික්කයේ නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2013 ජනවාරි මාසයේ සිට 2017 දෙසැම්බර් මාසය දක්වා කාලපරිච්ඡේදයේ වැඩිහිටි දීමනා ගෙවීම සඳහා රු.මිලියන 58.47 ක් තැපැල්පතිවරයා වෙත ප්‍රේෂණය කර තිබුණි. නමුත්, මුදල් ලබාගැනීමට ඉදිරිපත් නොවූ ප්‍රතිලාභීන්ගෙන් එකතුව රු.මිලියන 2.33 ක් මුදල් ඇණවුම් මගින් ලියාපදිංචි තැපෑලෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ආපසු එවා තිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පොත්පත් සහ ලේඛනවලට ඒවා ඇතුළත් නොකර විෂය ලිපිකරු විසින් එම මුදල් ඇණවුම් මාරු කර අයථා ලෙස මුදල් ලබාගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

**2.8 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම.**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 626.22 | 625.42 | 0.80 | 0.13 |
| | මූලධන | 39.42 | 38.65 | 0.77 | 1.95 |
| | **එකතුව** | **665.64** | **664.07** | **1.57** | **0.24** |
| 2014 | පුනරාවර්තන | 606.19 | 605.25 | 0.94 | 0.15 |
| | මූලධන | 415.18 | 411.48 | 3.70 | 0.89 |
| | **එකතුව** | **1,021.37** | **1,016.73** | **4.64** | **0.45** |
| 2015 | පුනරාවර්තන | 776.10 | 773.74 | 2.36 | 0.30 |
| | මූලධන | 80.00 | 53.23 | 26.77 | 33.46 |
| | **එකතුව** | **856.10** | **826.97** | **29.13** | **3.40** |
| 2016 | පුනරාවර්තන | 806.06 | 801.47 | 4.59 | 0.56 |
| | මූලධන | 69.20 | 66.75 | 2.45 | 3.54 |
| | **එකතුව** | **875.26** | **868.22** | **7.04** | **0.80** |
| 2017 | පුනරාවර්තන | 810.79 | 799.87 | 10.92 | 1.35 |
| | මූලධන | 124.56 | 85.17 | 39.39 | 31.62 |
| | **එකතුව** | **935.35** | **885.04** | **50.31** | **5.37** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

සමාලෝචිත වර්ෂය තුළ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සැලසුම් සකස් කර රු.මිලියන 90 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් සලසා ගෙන තිබුණද, වර්ෂය අවසාන වන විට මුළු ප්‍රතිපාදනයෙන් රුපියල් මිලියන 39 ක් හෙවත් සියයට 43 ක් ඉතිරි කර තිබුණි.

**(ආ) අධි ප්‍රතිපාදන සලසා තිබීම**

වැය විෂයයන් 06 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් එම ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි. එම වැය විෂයයන් වල මාරු කරන ලද ප්‍රතිපාදනය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 49 ත් සියයට 100 ත් අතර පරාසයක් ගෙන තිබුණි.

**(ඇ) වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

---

අමාත්‍යාංශ 25 ක්, දෙපාර්තමේන්තු 17 ක්, කාර්යාල 2 ක් විසින් විවිධ කාර්යයන් සඳහා පිළිවෙලින් රු.මිලියන 4,475.7 ක්, රු.මිලියන 100.8 ක්, හා රු.මිලියන 39.1 ක් වශයෙන් එකතුව රු.මිලියන 4,615.7 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රුපියල් මිලියන 3,773 ක් පමණක් උපයෝජනය කර තිබුණු බැවින්, ලබාදී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 843 ක් හෙවත් සියයට 18 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් ලද ප්‍රතිපාදනවලින් අමාත්‍යාංශ 08 කින් හා දෙපාර්තමේන්තු 02 කින් ලද ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට 85 දක්වා ප්‍රතිපාදන ඉතිරි කර ආපසු යවා තිබුණි.

(ii) 2017 ග්‍රාමීය යටිතල පහසුකම් නගාසිටුවීමේ වැඩසටහන සඳහා රු.මිලියන 347 ක් ප්‍රතිපාදන සලසා තිබූ නමුත්, සමාලෝචිත වර්ෂය අවසානයට උපයෝජනය කර තිබූ වටිනාකම රු.මිලියන 326.36 ක් වූයෙන් රු.මිලියන 20.64 ක ඉතිරියක් නිරීක්ෂණය විය.

(iii) 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන කාර්යය සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් රු.මිලියන 2.2 ක ප්‍රතිපාදන සලසා දී තිබුණද, 2017 වර්ෂයේ එකතුව රු.මිලියන 1.1 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබූ අතර, මුළු ප්‍රතිපාදනයෙන් සියයට 50 ක් භාවිත කර නොතිබුණි.

(iv) 2017 වර්ෂයේ කුඩා ව්‍යාපාර අංශයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව සාමාන්‍ය වැඩසටහන්, රූපලාවන්‍යාගාර වැඩසටහන් සහ ස්වශක්ති ණය යන වැඩසටහන් තුනෙහි ව්‍යාපෘති 16 ක් සඳහා රු.990,420 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ දී එම වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

**2.9 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

---

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

---

අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 27401 දරන රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 75 | 74 | 49 | 50 | 230 | 195 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 9 කට අයත් වැඩ තහනම් කර තිබුණු නිලධාරීන් 10 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂවල එකතුව රු.1,537,711 ක් වූ අතර, එයින් නිලධාරීන් 5 දෙනෙකුගේ එකතුව රු.966.475 ක් වූ ණය ශේෂ වර්ෂ 5 කට වඩා පැරණි අයවිය යුතු ණය ශේෂයන් විය.

(ආ) රාජාංගන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිට තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ස්ථානමාරු වී ගිය ග්‍රාම නිලධාරී වරයෙකුගෙන් අයවිය යුතු රු.26,613 ක මුදලක් වසර 5 කට වැඩි කාලයක සිට අයවී නොතිබුණි.

**2.10 පොදු තැන්පත් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්මවූ (ඉඩම් තැන්පතු හැර) රු.6,172,784 ක් වූ තැන්පතු ගිණුම් 05 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේනපුර වී ගබඩාව අලුත්වැඩියාව සඳහා වී අලෙවි මණ්ඩලය විසින් ලබාදී තිබුණු මුදලින් ඉතිරි වූ රු.123,271 ක් සඳහා වෙනත් ඇස්තමේන්තුවක් සකස් කර වී අලෙවි මණ්ඩලය වෙත යොමු කර අනුමැතිය ලබාදෙන තුරු ආපසු නොයවා පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

(ඇ) නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වසර 2 ක් ඉක්මවූ කල් ඉකුත් වූ තැන්පතු ලෙස හඳුනාගෙන තිබුණු රු.90,369 ක් වූ පොදු තැන්පත් මුදල්, මුදල් රෙගුලාසි 571 වගන්තියේ උපදෙස් ප්‍රකාර රජයේ ආදායමට ගැනීමට හා අතරුදවූම් නිදහස් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.11 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

2015 මාර්තු 16 දිනැති සමාජ සේවා, සුභසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ අංක 01/2015 දරන චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 ක් විසින් පවත්වා ගතයුතු වැඩිහිටි දීමනා ගෙවීම් සම්බන්ධව නඩත්තු කළයුතු නොගෙවූ වැඩිහිටි දීමනා ලේඛනය, දීමනා ගෙවීම් ලෙජරය හා මාසික සාරාංශ වාර්තා හා පොරොත්තු ලේඛනය යන ලේඛන පවත්වා නොතිබුණි.

**2.12 අනුකූල නොවීම්**

**2.12.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (i) | අංක 1/9/2/18 දරන 2016 මාර්තු 03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ ලිපිය | 18,518,095 | රඹෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉදිකිරීම් සංවර්ධන ව්‍යාපෘති 61 ක් ඉදිකිරීම්, කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය ලබාගෙන නොතිබුණු ප්‍රජා පාදක සංවිධාන 4 කට සෘජුව කොන්ත්‍රාත් පවරා දී තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 103(1), 104(1), 105(1) හා 128 | වටිනාකම් හඳුනාගෙන නොතිබුණි. | මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වහළ අලුත්වැඩියා කිරීමේදී වත්කම්වල ආරක්ෂාවට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගෙන වහළය ගැලවීම හේතුවෙන් කාර්යාල උපකරණ 22 කට අලාභහානි සිදුවී තිබුණි. අලාභහානි වටිනාකම හඳුනාගෙන නොතිබුණි. |
| (iii) | ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ 2017 ජනවාරි 11 දිනැති අංක MNPEA/02/2017 දරන චක්‍රලේඛය | 18,518,095 | රඹෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහනේ සංරචක 8 ක් සඳහා වූ සමස්ථ ප්‍රතිපාදනවලින් යටිතල පහසුකම් වර්ධනය සඳහා හඳුනාගත් සංරචක 03 ක් සඳහා පමණක් වැයකර තිබුණු අතර, මේ හේතුවෙන් රැකියා හා ජීවනෝපායන් අවස්ථා වර්ධනය කිරීම, ග්‍රාමීය ප්‍රජාවගේ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම, තරුණ තරුණියන්, කාන්තාවන් අතර ස්වයංරැකියා ජනනය කිරීම වැනි මෙම වැඩසටහනේ අරමුණු ඉටු වී නොතිබුණි. |
| (iv) | දිවිනැගුම අධ්‍යක්ෂ ජනරාල්ගේ 2016/03 හා 2017/06 දරන චක්‍රලේඛ | 1,287,500 | තලාව හා නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දිවිනැගුම සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහනට අදාළ ශිෂ්‍යත්ව අරමුදල් අප්‍රමාදව ගෙවිය යුතු වුවත්, මාස 01 සිට මාස 18 දක්වා කාලප්‍රමාදයක් සහිතව ශිෂ්‍යත්ව දීමනා ගෙවා තිබුණි. |
| (v) | දිවිනැගුම අධ්‍යක්ෂ ජනරාල්ගේ 2016/05 දරන චක්‍රලේඛය | 3,681,000 | සමාජ ආරක්ෂණ ප්‍රතිලාභීන්ගේ මරණයකදී අවමංගල්‍ය කටයුතු අවසන් කිරීමට පෙර ප්‍රතිලාභ ගෙවිය යුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 4 ක ප්‍රතිලාභීන් 254 ක් සඳහා ප්‍රතිලාභ ගෙවීමේ දී සැලකිය යුතු කාලප්‍රමාදයක් ගෙන තිබුණි. |

## 2.13 මානව සම්පත් කළමනාකරණය

### 2.13.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රුපියල් මිලියන 710.07 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.332,241 ක් වී තිබුණි.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| i. ජ්‍යෙෂ්ඨ මට්ටම | 107 | 77 | 30 |
| ii. තෘතියික මට්ටම | 54 | 20 | 34 |
| iii. ද්විතියික මට්ටම | 2,329 | 1,854 | 475 |
| iv. ප්‍රාථමික මට්ටම | 221 | 186 | 35 |
| එකතුව | 2,711 | 2,137 | 574 |